සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

32	S	I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය .... **ව්‍යාපාර අධ්‍යයනය I** කාලය පැය දෙකයි

උපදෙස්

- ♦ සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ♦ ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- ♦ සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

1. පීරිස් මහතා විසින් රචනා කරන ලද ප්‍රථම නවකතාව පසුගියදා වෙළෙඳපොළට නිකුත් කරනලදී. එයඅයත් වනුයේ,
   1. කාර්මික භාණ්ඩ වලටය.
   2. විශේෂිත භාණ්ඩ වලටය.
   3. සාප්පු භාණ්ඩ වලටය.
   4. නොසෙවූ භාණ්ඩ වලටය.
   5. පහසු භාණ්ඩ වලටය (.....)

02. පහත සඳහන් දෑ අතුරින් ව්‍යාපාරයක ප්‍රධාන අරමුණක් ලෙස සැලකිය නොහැකි කරුණ කුමක්ද?
   1. ලාභ උපරිම කිරීම.
   2. රැකියා අවස්ථා උපරිම කිරීම.
   3. විකුණුම් උපරිම කරගැනීම.
   4. වෙළෙඳපොළ කොටස උපරිම කර ගැනීම.
   5. වෙළෙඳපොළේ රැඳී සිටීම. (.....)

03. පහත දැක්වෙන්නේ විවිධ නිෂ්පාදන අවස්ථා පැහැදිලි කෙරෙන ප්‍රකාශ කිහිපයකි.
   - A - සඳලී අමුද්‍රව්‍ය ලෙස පොල්කොළ යොදාගනිමින් අත්බෑග් නිපදවා ඇයගේ පරිහරණයට යොදාගනී.
   - B - කමනී තම නිවස ඉදිරිපස මල්පැළ තවානක් ආරම්භකර විසිතුරු මල් පැළ අලෙවිකරයි.
   - C - සයුරී විනෝදාංශයක්ලෙස ඉවතලන ද්‍රව්‍ය භාවිතා කර බිත්ති සැරසිලි නිපදවයි.
   - D - බිනරී ඇඟලුම් කම්හලකින්ඉවතලන රෙදි කැබලි මිලටගෙන බෝනික්කන් නිපදවා අලෙවි කිරීමට සැලසුම් කරයි.
   - E - අශානි අඩු දර ප්‍රමාණයක් භාවිතාකළ හැකි වැඩි උණුසුමක් රඳ පවතින නවතම දරලිපක් නිපදවා වෙළෙඳපොළට ඉදිරිපත් කරයි.

   ඉහත ප්‍රකාශ පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   1. A හා C ඍජු නිෂ්පාදනය වන අතර B,D,E වක්‍ර නිෂ්පාදනය වේ.
   2. B,D හා A ඍජු නිෂ්පාදනය වන අතර C හා E වක්‍ර නිෂ්පාදනය වේ.
   3. D හා A ඍජු නිෂ්පාදනය වන අතර B,C හා E වක්‍ර නිෂ්පාදනය වේ.
   4. E හා D ඍජු නිෂ්පාදනය වන අතර A, B හා C වක්‍ර නිෂ්පාදනය වේ.
   5. ඉහත සියලුම ප්‍රකාශ වක්‍ර නිෂ්පාදනය පිළිබඳ ප්‍රකාශ කරයි. (.....)

04. පුවත්පත් නිවේදන කිහිපයක් පහත දැක්වේ.
   1. උසස් අධ්‍යාපනය ලබන බොහෝ දෙනා අධ්‍යාපන කටයුතු සඳහා අන්තර්ජාලය භාවිතා කරයි.
   2. ණය සඳහා වන පොළී අනුපාතය නැවතත් පහළට
   3. රටේ ව්‍යාපාර සියල්ල රජය යටතේ පවත්වාගෙන යාමට නව රජය තීරණය කරයි.
   4. කම්කරු නීති රීති සංශෝධන පනත පාර්ලිමේන්තුවේ සම්මත වේ.

ඉහත සඳහන් නිවේදන මගින් විස්තරවන සාර්ව පරිසර බලවේග පිලිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,

1. ආර්ථික පරිසරය/දේශපාලන පරිසරය/තාක්ෂණිකපරිසරය/ප්‍රජා පරිසරය
2. තාක්ෂණික පරිසරය/ආර්ථික පරිසරය/දේශපාලන පරිසරය/නෛතික පරිසරය
3. ප්‍රජා පරිසරය/ආර්ථික පරිසරය/දේශපාලන පරිසරය/නෛතික පරිසරය
4. ගෝලීය පරිසරය/දේශපාලන පරිසරය/නෛතික පරිසරය/තාක්ෂණික පරිසරය
5. තාක්ෂණික පරිසරය/දේශපාලන පරිසරය/ආර්ථික පරිසරය/නෛතික පරිසරය. (.....)

05. පහත වගුව ව්‍යාපාර ආචාර ධර්ම හා සම්බන්ධ වේ. එක් එක් ශ්‍රිතයන්ට අදාළ ව්‍යාපාර ආචාර ධර්ම නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

ව්‍යාපාර ශ්‍රිතය	**ආචාර ධර්මයන්**
A මූල්‍ය අංශය	1. තරග විරෝධී චර්යාවන්ගෙන් මිදීම.
	2. පරිසර දූෂණය අවමවන පරිදි කටයුතු කිරීම.
B මානව සම්පත් අංශය	3. පාරිභෝගිකයින් රැවටීමට ලක් නොකිරීම.
	4. අනවශ්‍ය ගෙවීම් හා වියදම් වැළැක්වීම.
C අලෙවිකරණ අංශය	5. වෘත්තීය ආරක්ෂාව සැලසීම.
	6. යහපත් ජීවන තත්වයක් පවත්වාගෙන යාම.
D නිෂ්පාදන අංශය	7. විනිමය වංචා වළක්වාලීම.
	8. මිනිසාට අහිතකර ද්‍රව්‍ය නිෂ්පාදනය නොකිරීම.

1. A - 4,6 B- 5,7 C - 2,3 D - 1,8
2. A-4,7 B - 5,6 C - 1,2 D - 3,8
3. A - 4, 7 B - 5, 6 C - 1, 3 D - 2, 8
4. A - 7,1 B-6,8 C-2,4 D-3,5
5. A-6,3 B-4,5 C-1, 2 D-7,8 (.....)

06. රජයේ මූල්‍ය ප්‍රතිපත්තියට ඇතුළත් වන්නේ,

1. පොලී හා මුදල් සැපයුම පාලනය
2. බදු හා ගාස්තු පාලනය
3. වර්තන වියදම් පාලනය
4. ප්‍රාග්ධන වියදම් පාලනය
5. රාජ්‍ය ආදායම් හා වියදම් පාලනය (.....)

07. පාරිභෝගික අයිතීන් හා වගකීම් පහත දැක්විය.

X	**Y**
පාරිභෝගික වගකීම්	1. තොරතුරු දැනගැනීම
	2. පරිසර දැනුවත්භාවය
	3. සමාජය පිළිබඳ සැලකිල්ල
පාරිභෝගික අයිතිවාසිකම්	4. තෝරාගැනීම
	5. පාරිභෝගික අධ්‍යයනය
	6. විචාරාත්මක දැණුවත්භාවය
	7. මූලික අවශ්‍යතා ඉටුකිරීම

ඉහත කරුණු අතරින්පාරිභෝගික අයිතිවාසිකම් පමණක් ඇතුළත්වන්නේ,

1. 1, 2, 3, 7
2. 2, 3, 4, 5
3. 1, 4, 5, 7
4. 1, 2, 5, 6
5. 3, 4, 5, 6 (.....)

08. ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සඳහා වූ අන්තර්ජාතික ප්‍රමිතිය,

1. ISO 9001, 2005
2. ISO 14001, 2005
3. ISO 27000
4. OHSAS 18001- 2007
5. ISo 22000 (.....)

09. පහත නීති මූලාශ්‍ර හවුල් ව්‍යාපාරවලට බලපාන ආකාරය ගලපා ඇති පිළිතුර තෝරන්න.

	නීති මූලාශ්‍රය		අදාළත්වය
1.	2007 අංක 7 දරණ සමාගම් පනත	A	ලිඛිත ගිවිසුමක අවශ්‍යතාවය
2.	1890 හවුල් ව්‍යාපාර ආඥා පණත.	B	ව්‍යාපාර නාම ලියාපදිංචිය
3.	1840 වංචා වැළැක්වීමේ ආඥා ගණත	C	සාමාජික සංඛ්‍යාව
4.	1918 ව්‍යාපාර නාම ආඥා පණත	D	හවුලේ ස්වභාවය

1. 1-B 2-C 3-D 4-A 2. 1-D 2-C 3-A 4-B 3. 1-A 2-B 3-C 4-D
4. 1-C 2-D 3-A 4-B 5. 1-D 2-A 3-B 4-C (.....)

10. හවුල් ඔප්පුවක සඳහන් නොවූ හෝ හවුල් ඔප්පුවක් නොමැති විටක ක්‍රියාත්මක වියයුතු ආකාරය පිළිබඳව 1890 හවුල් ව්‍යාපාර ආඥා පණතේ 24 වැනි වගන්තියේ දක්වා ඇත. එහි සඳහන් නොවන වගන්තිය කුමක්ද?
1. ප්‍රාග්ධනයට සමානව දායක වී ලාභාලාභ සමානව බෙදා ගත යුතුය.
2. ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා හිමිකරුවන්ට 5% ක වාර්ෂික පොලියක් ලැබිය හැකිය.
3. ගැනිලි සඳහා පොළිය 2% කි.
4. නව හවුල්කරුවෙකු බඳවාගැනීමේදී සියලු හවුල්කරුවන්ගේ අනුමැතිය ලබා ගත යුතුය.
5. ව්‍යාපාරයේ සියලු ගිණුම්පොත් පත් ප්‍රධාන කාර්යාලයේ තිබිය යුතුය. (.....)

11. සමුපකාර සමිතියක් ලියාපදිංචි කරනුයේ,
1. සමාගම් රෙජිස්ට්‍රාර්වරයා මගින්ය.
2. ප්‍රාදේශීය ලේකම්වරයා මාර්ගයෙනි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයායා.
4. ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙනි.
5. ජාත්‍යන්තර සමුපකාර සංවිධානය මගිනි. (.....)

12. රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. සංස්ථාපනය කරනු ලබන්නේ විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පණතක් මගිනි.
2. පූර්ණ වශයෙන් රාජ්‍ය අයිතියේ හෝ 51% ට වැඩි කොටස් ප්‍රමාණයක් රජය සතු වේ.
3. වගකීම් අසීමිත වේ.
4. නෛතික පුද්ගලභාවයක් ඇත.
5. නීතිමය කටයුතු වලදී සංස්ථා ප්‍රධානියාගේ නිල නාමයෙන් පෙනී සිටිය යුතුය. (.....)

13. පහත දැක්වෙන්නේ ව්‍යවසායකත්වය තුළින් අත්වන ප්‍රතිලාභ කීපයකි.
- A තරඟකාරිත්වයට මුහුණ දීමට පහසු වීම.
- B ව්‍යාපාර කටයුතු පුළුල්වීම.
- C සමාජ තත්වය හා පිළිගැනීම ඇතිවීම.
- D වෙළෙඳපොළ කොටස පුලුල් වීම.
- E ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබාගතහැකි වීම.
- F අඛණ්ඩව වර්ධනය වීම.

ඉහත දෑ අතුරෙන් ආයතනික ප්‍රතිලාභ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.
1. A,B, C, E 2. A, C, D, E 3. B, C, D, E 4. A,B, D, F 5. B, D, E, F (.....)

14. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණයක් නොවන්නේ,
1. වෙළෙඳපොළ කුඩාවීම
2. සේවක සංඛ්‍යාව අඩුවීම.
3. නවීන තාක්ෂණය භාවිතය අඩුවීම.
4. වැඩි රැකියා ප්‍රමාණයක් සැපයිය හැකිවීම.
5. පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිතා කිරීම. (.....)

15. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා රජය ගෙන ඇති මූල්‍යමය නොවන දිරිගැන්වීමක් වන්නේ,
1. ප්‍රතිමූල්‍ය පහසුකම්
2. බදු සහන
3. විශිෂ්ටතා හා සම්මාන ලබාදීම.
4. කෙටිකාලීන හා දිගුකාලීන ණය
5. මූල්‍යමය ආධාර (.....)

16. අමල් 2017 ජනවාරි මස රු. 10000 කට මිලට ගත් භාණ්ඩ තොගයක් සඳහා 2017 අප්‍රේල් මස මුදල් ගෙවීමට ගිවිස ගත්තේය. මෙමගින් මුදලේ කුමන කාර්යයක් ඉටු කරනු ලබන්නේද?
   1. වටිනාකම මැනීමේ මිණුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම.
   2. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
   3. අතරමැදි මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
   4. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම.
   5. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම. (.....)

17. බලපත්‍රලාභී විශේෂි බැංකුවක් වන්නේ,
   1. ලංකා බැංකුව 2. සම්පත් බැංකුව 3. මහජන බැංකුව
   4. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 5. සෙලාන් බැංකුව (.....)

18. මහජනයාට කරනු ලබන සුරැකුම් නිකුතුවකදී ඒ සඳහා විවිධ සේවා සපයන ආයතන හැඳින්වෙන්නේ,
   1. වෙළෙඳපොළ අතරමැදියන් ලෙසය. 2. ප්‍රාරක්ෂකයන් ලෙසය.
   3. ආන්තික සැපයුම්කරුවන් ලෙසය. 4. ආයෝජන කළමනාකරුවන් ලෙසය.
   5. කොටස් තැරැව්කරුවන් ලෙසය. (.....)

19. පහත සඳහන් වන්නේ විවිධ අවදානම් වලට අදාළ ප්‍රකාශයන් කීපයකි.
   A ඥාණපාල අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය ඇතුලු සියලු විෂයන් අසමත් විය.
   B උපකාරක පංති පවත්වාගත් ගුරුවරයාට අයිති වටිනා වාහනය වියානා ඇලට වැටී අනතුරකට ලක්වී ඇත.
   C සහන්ගේ නිවසට හොරු පැන මුදල් හා රන්භාණ්ඩ පැහැරගෙන ගොස් ඇත.
   D දසුන්ගේ ව්‍යාපාරය පසුගිය වසරේ විකිණීම සඳහා මිලදී ගත් ඇඳුම් මෝස්තර යල්පැනීම නිසා විශාල අලාභයකට මුහුණ දී ඇත.
   E අයහපත් දේශගුණය නිසා මෙවර වියළිකලාපයේ වී ඇතුලු අනිකුත් භෝග විනාශයට පත්වී ඇත.

   ඉහත ප්‍රකාශ අතරින් රක්ෂණය කළහැකි අවදානම් වලට අදාළ ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
   1. A,B හා C පමණි. 2. AB හා D පමණි. 3. B,C හා D පමණි.
   4. B,C හා E පමණි. 5. CD හා E පමණි. (.....)

20. පහත දැක්වෙන්නේ X තීරුවේ රක්ෂණ මූලධර්මත් Y තීරුවේ එම මූලධර්මවලට අයත් වාක්‍ය ඛන්ඩ සමූහයකුත්ය. එම X හා Y තීරු නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

X	Y
1. රක්ෂණ හිමිකම	A සඳුන් තම මෝටර් රථය රක්ෂණ ආයතන කීපයක රක්ෂණය කර ඇති අතර, මෝටර් රථයට වූ හානියට වන්දි ලබාගැනීම.
2. උපරිම විශ්වාසය	B සහන් තම ව්‍යාපාරයේ විශාල අගයන් සහිත භාණ්ඩ ණයට විකුණයි. ඔහු තම ණය ගැතියන් රක්ෂණය කරයි.
3. හානිපූරණය	C ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබාගත් පුද්ගලයෙකු සියදිවි හානිකර ගැනීම.
4. ආසන්නතම හේතුව	D පතල් කර්මාන්තයේ නියැලී සිටින සරත් ජීවිත රක්ෂණයක් ගැනීමට තම වෘත්තිය පිළිබඳ තොරතුරු රක්ෂණ ආයතනයට දැනුම්දීම.
5. දායකත්වය	E දසුන්තම මෝටර් රථය රක්ෂණය කර ඇති අතර එය අනතුරට ලක්වීම සම්බන්ධව රක්ෂණ ආයතනය පියවර ගැනීම.

   1. A1 B2 C4 D3 E5 2. A5 B1 C4 D2 E3
   3. A5 B2 C1 D3 E4 4. A5 B1 C4 D3 E2
   5. A1 B2 C3 D4 E5 (.....)

21. සඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
   1. සංක්ෂිප්ත බව 2. පිරිවැය අවම බව 3. නිශ්චිත නොවන බව
   4. පූර්ණ බව 5. ආචාරශීලී බව (.....)

22. අභ්‍යන්තර ලිඛිත විද්‍යුත් නොවන සන්නිවේදන මාධ්‍යයක් වන්නේ,
1. ඉන්ටර්කොම් 2. මෙමෝ පත්‍ර 3. e-mail 4. පුවත්පත් 5. දුරකථන (.....)

23. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් නොවන්නේ,
1. ප්‍රතිචාරය 2. ප්‍රතිපෝෂණය 3. මාධ්‍ය 4. ප්‍රතිග්‍රහනය 5. පණිවුඩය (.....)

24. වෙළෙඳපොළ සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයටද වැදගත් වූ ව්‍යාපාර සේවාවක් ලෙස ප්‍රවාහනය දැක්විය හැක. ඒ අනුව කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක පැවතිය යුතු මූලිකාංග කාණ්ඩය තෝරන්න.
1. පිරිවැය, බලය, පර්යන්තය, සුලබතාව. 2. බලය, මාර්ගය, වේගවත් බව, පර්යන්තය
3. මාර්ගය, මාධ්‍යය, ආරක්ෂාව, ධාරිතාව. 4. මාධ්‍ය, මාර්ගය, බලය, පර්යන්තය
5. ආරක්ෂාව, ධාරිතාව, සුලබතාව, පිරිවැය. (.....)

25. පහත X හා Y වගුවෙන් දැක්වෙන්නේ ප්‍රවාහන මූලිකාංග හා මූලිකාංගවලට අදාළ නිදසුන් ය. මෙම X, Y තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

	X	Y
A	මාර්ගය	1. දුම්රිය
B	මාධ්‍යය	2. ගුවන්තොටුපල
C	බලය	3. දුම්රිය මාර්ගය
D	පර්යන්තය	4. සුළඟ
		5. බස්නැවතුම්පොළ
		6. ගෑස්
		7. මහාමාර්ග
		8. බෝට්ටුව

1. A-3,2 B-1,7 C-5,4 D-6,8 2. A-3,4B-2,5 C-1,6 D-7,8
3. A-3,1 B-2,4 C-6,8 D-5,7 4. A-3,5B-6,8 C-2,4 D-1,7
5. A-3,7 B-1,8 C-4,6 D-2,5 (.....)

26. සිසිර මගී ප්‍රවාහන බස් සේවාවක් ඇරඹීමට අදහස් කරයි. ඊට අදාළ නීතිමය කරුණු පහත වේ. ඔහුට බලනොපාන නීතිමය නොවන කරුණ ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ප්‍රවාහන රථය ලියාපදිංචිය. 2. වාර්ෂික ආදායම් බලපත්‍රය 3. මාර්ග නීති පිළිපැදීම.
4. රක්ෂණ සහතිකය 5. රථය සුබෝපභෝගී වීම. (.....)

27. තොග වෙළඳාම සිල්ලර වෙළෙඳාමෙන් වෙන්කරන ප්‍රධාන සාධකය වන්නේ,
1. භාණ්ඩයේ ප්‍රමාණය 2. භාණ්ඩයේ පිරිවැයයි. 3. ලබාදෙන වට්ටම් ප්‍රමාණයයි.
4. මිලට ගන්නාගේ අරමුණයි. 5. භාණ්ඩයේ මිලයි. (.....)

28. තොග වෙළෙන්දෙකු ඉටුකරනු ලබන කාර්යයක් වන්නේ,
1. පාරිභෝගික අවශ්‍යතා අනුව භාණ්ඩ ලබාදීම. 2. භාණ්ඩ පාරිභෝගිකයාට හඳුන්වා දීම.
3. භාණ්ඩ ප්‍රවාහනය කරදීම. 4. භාණ්ඩ පිළිබඳ තොරතුරු පාරිභෝගිකයාට සැපයීම.
5. තොග වෙළෙන්දාට තොරතුරු සැපයීම. (.....)

29. භාණ්ඩ වරායෙන් නිදහස්කරගැනීමට ලියවිලි ආනයනකරුවෙකුට ලැබී නොමැති අවස්ථාවක එකී භාණ්ඩ වරායෙන් ඉවත්කර ගැනීමට ඉදිරිපත් කළයුතු ලියවිල්ල වන්නේ,
1 හානි රක්ෂණ ලිපියයි. 2. ආනයන සටහන්කරයයි. 3. අවලෝකන පත්‍රයයි.
4. නෞභාර පත්‍රයයි. 5. හානි රක්ෂණ සහතිකයයි. (.....)

30. විද්‍යුත් ව්‍යාපාර වඩාත් හොඳින් විස්තර කරන්නේ,
1. පරිගණක ඇසුරින් වෙළෙඳ කටයුතුවල නිරතවීම.
2. විද්‍යුත් ජාල ඔස්සේ ගණුදෙනු සිදුකිරීමයි.
3. සමස්ථ ව්‍යාපාර ක්‍රියාවලිය මෙහෙයවීම විද්‍යුත් ජාල ඔස්සේ සිදුකිරීම.
4. ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් භාවිතය
5. ව්‍යාපාර වල අලෙවිකරන හා මෙහෙයුම් කටයුතු අන්තර්ජාලය ඔස්සේ සිදුකිරීම. (.....)

❖ **අංක 31 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවලට සුදුසු වචනය, වාක්‍ය ඛණ්ඩය හිස්තැන මත ලියන්න.**

31. (අ) නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගන්නා භාණ්ඩ .... ලෙස හඳුන්වයි.

(ආ) ස්පෘශ්‍ය (tangible) සහ අස්පෘශ්‍ය (Intangible) නිෂ්පාදිත පිළිවෙළින් .... හා .... ලෙස හඳුන්වයි.

32. (අ) පරිසර සංවිධාන, පාරිභෝගික සංවිධාන යනාදියට ව්‍යාපාර ආයතන කෙරෙහි වාසිදායක මෙන්ම අවාසිදායක බලපෑම්ද කළ හැකිය. මෙවැනි කණ්ඩායම් .... ලෙස හැඳින්වේ.

(ආ) නිෂ්කර්ශක කර්මාන්තවලින් ලබාගන්නා .... මත නිර්මාණක කර්මාන්ත රඳා පවතින අතර නිර්මාණක කර්මාන්ත වල .... ම නිෂ්කර්ශක කර්මාන්ත රඳා පවතී.

33. (අ) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සමාජ වකීම් ඉටුකිරීමේදී ව්‍යාපාර විසින් ප්‍රමුඛතාව දියයුතු අංක 4 ලෙස දක්වා ඇත්තේ

...., ...,

...., ...,

(ආ) පාරිභෝගිකයින්ට ඇති ව්‍යාපාර සමාජ වගකීම් ව්‍යාපාරවලට ඉටු කළ හැකි ආකාර ලෙස .... සහ .... දැක්විය හැකිය.

34. (අ) පරිසර සුරක්ෂිතතාවය සඳහා වූ අන්තර්ජාතික ප්‍රමිතිය .... වශයෙන්ද, තොරතුරුවල සුරක්ෂිතතාව සම්බන්ධ ප්‍රමිතිය .... වශයෙන්ද නම් කෙරේ.

(ආ) ඍජු බදු වර්ග දෙකක් වශයෙන් .... හා .... බදු හඳුන්වා දිය හැකිය.

35. ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලදුව ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු කරගෙනයාමට මෙරට සමාගම් පනතෙන් සංස්ථාපනය කළ සමාගම් .... වන අතර එක් රටක මූලස්ථානය පවත්වාගෙන යමින් රටවල් එකකට වඩා වැඩි ප්‍රමාණයක ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන දැවැන්ත පොදු සමාගම් .... නම් වේ.

36. (අ) පරිසර අවස්ථා .... උකහා ගනිමින් අවදානමක් දරා .... බිහි කිරීමේ ක්‍රියාවලිය ව්‍යවස්ථායකත්වයයි.

(ආ) ප්‍රායෝගික අදහසක් තුළින් .... බිහිකරන්නා ව්‍යවසායකයාය.

37. (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීමට රජය ගෙන ඇති පියවර .... හා .... ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

(ආ) සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට ණය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමය .... ලෙස හැඳින්වේ.

38. (අ) වෙළෙඳ ආයතන ගනුදෙනුකරුවන්ට ලබාදී ඇති වෙළෙඳ ණය අය කිරීම සහ ණය මිලදී ගැනීම සිදු කරනු ලබන ආයතන .... ලෙස හැඳින්වේ.

(ආ) නවීනතම තාක්ෂණය මත පදනම් වූ ලොව පුරා මූල්‍ය වෙළෙඳපොළවල් ආවරණය කෙරෙන ජාලය .... ලෙස හැඳින්වේ.

39. රක්ෂාභිමිකම, උපරිම විශ්වාසය යන මූලධර්ම ආ).. හා .... රක්ෂණයට බලපාන අතර, හානිපූරණ මූලධර්ම ආ) .... රක්ෂණයට බලපායි.

40. (අ) ප්‍රාදේශීය වෙළෙඳාම .... හා .... වෙළඳාම වශයෙන් වර්ග කෙරේ.

(ආ) විදේශ වෙළඳාම .... හා .... වෙළඳාම ලෙස වර්ග කෙරේ.

❖ **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ කාර්මික අංශයට අයත් අංශ නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

42. නිෂ්පාදන ආයතනයකට භාවිතා කළ ISO ප්‍රමිති හතරක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

43. තිරසාර සංවර්ධනය උදෙසා වූ අපද්‍රව්‍ය කළමණාකරණයේ (4R) සංකල්පය (4R) ලෙස යොදා ගැනෙනුයේ මොනවාද?

1. ....
2. ....
3. ....
4. ....

44. රජය ව්‍යාපාර වලට බලපෑම් සිදුකරනු ලබන ආකාරයන් 4ක් නම් කරන්න.

. ...
2. ....
3. ....
4. ....

45. විධිමත් සංවිධානයක මූලික අංග මොනවාද?

1. ....
2. ....
3. ....
4. ....

46. සීමාසහිත පොදු සමාගමකට සාපේක්ෂව පෞද්ගලික සමාගමක දැකියහැකි අහිතකර ලක්ෂණ 4ක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

47. ව්‍යවසායකත්ව කුසලතා 4ක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

48. ස්වයංක්‍රීයව බැංකු සේවා තුළින් ගනුදෙණුකරුවන්ට අත්වන වාසි 4ක් දක්වන්න.

1. ....
2. ....
3. ....
4. ....

49. ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන් 4ක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

50. විද්‍යුත් වෙළෙඳමක් සිදුවිය හැකි ආකාර 4ක් දක්වන්න.

1. ....
2. ....
3. ....
4 . ...

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

32	S	II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 12 - 2018

විභාග අංකය .... **ව්‍යාපාර අධ්‍යයනය II** කාලය පැය තුනයි

- **උපදෙස් :- ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

I කොටස

01. (i) (අ) ''මිනිසාගේ පැවැත්මට හා සංවර්ධනයට ව්‍යාපාරයන්හි දායකත්වය අත්‍යාවශ්‍ය වේ.'' මෙම ප්‍රකාශය හා ඔබ එකඟවන්නේද පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර අපේක්ෂාවන් යනු මොනවාද? (ලකුණු 2)

(ii) ''බුද්ධිමා'' නගරයේ පිහිටි ප්‍රසිද්ධ පෞද්ගලික පාසලකි.

(අ) මෙම ආයතනයසපයන සේවාවේ ස්වභාවය කුමක්ද? (ලකුණු 2)

(ආ) භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් මොනවාද? (ලකුණු 2)

(iii) (අ) ''වර්තමාන ව්‍යාපාර ගනුදෙනුකරු කේන්ද්‍රකරගෙන පවත්වාගෙන යයි.'' පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) කාර්මික විප්ලවය නිෂ්පාදනයට හා වෙළෙඳමට බලපෑම්කළ ආකාර දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

(iv) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ගේ බලපෑම් වර්ධනය වෙමින් පවතී.

(අ) ඇල්මැති පාර්ශව නම් කරන්න. (ලකුණු 2)

(ආ) එම ඇල්මැති පාර්ශව හතරක් තෝරාගෙන එම පාර්ශව ව්‍යාපාරයකට වැදගත්වීමට හේතු දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) අභ්‍යන්තර පරසර බලවේග හතරක් නම්කර, එම බලවේග හා බැඳුණු ශක්තීන් හා දුර්වලතා එක බැගින් ලියා දක්වන්න. (ලකුණු 2)

(ආ) ඔබ කැමති සාර්ව පරිසරබලවේග දෙකක් තෝරාගෙන, එම පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇතිකරනබලෑම නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 2)

02. (i) (අ) ශ්‍රම විභජනය හා විශේෂීකරණය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) තිරසාර සංවර්ධනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) තිරසාර සංවර්ධනය යථාර්ථයක් බවට පත්කිරීම සඳහා ව්‍යාපාරද ක්‍රියාකාරීව දායකවිය යුතුය.

(අ) පාරිසරික තිරසාර බව තහවුරු කිරීමට ව්‍යාපාරයකට කළහැකි දෑ හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) තිරසාර සවර්ධනය පිළිබඳ විවිධ නිර්වචන ඇසුරින් ඔබගේම නිර්වචනයක් ගොඩනගන්න (ලකුණු 2)

(iii) තිරසාර සවර්ධනයේදී විශේෂයෙන් අවධානය යොමුකරන ක්ෂේත්‍ර 3 මොනවාදැයි සඳහන් කර ඒ එක් එක් ක්ෂේත්‍ර පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 4)

(iv) (අ) සමාජ වගකීම් පිළිබඳ සැලකිල්ලක් නොදක්වන ව්‍යාපාර ඉතා ඉක්මනින් අසාර්ථකත්වයට පත්වේ. එහෙයින් ව්‍යාපාර සමාජ වගකීම් ඉටුකිරීම ව්‍යාපාරයකට අතිශය වැදගත් වේ. ව්‍යාපාර සමාජ වගකීම් යනු මොනවාද? (ලකුණු 2)

(ආ) සමාජ වගකීම් ඉටුකිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන වාසි 4ක් දක්වන්න. (ලකුණු 2)

(v) (අ) රජය අනුගමනය කරන මුල්‍ය ප්‍රතිපත්තිය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)
(ආ) රජය පනවනු ලබන බදු නිසා ව්‍යාපාර වලට ඇතිවන බලපෑම් 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

03. (i) (අ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)
(ආ) ජෝන් එෆ් කෙනඩි හඳුන්වාදුන් පාරිභෝගික අයිතිවාසිකම් 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ii) (අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ක්‍රියාත්මක කරන ප්‍රමිතීන් 4ක් නම් කරන්න. (ලකුණු 2)
(ආ) ප්‍රමිතීන් අනුගමනය කිරීමෙන් රටකට ලබාගත හැකි ප්‍රතිලාභ 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(iii) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගික ආරක්ෂාව සඳහා සිදුකරනු ලබන කාර්යයන් 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)
(iv) (අ) හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන බෙදෙන ආකාරය ගැලීම් සටහනක දක්වන්න. (ලකුණු 2)
(ආ) සමාගමක සීමිත වගකීම් යනුවෙන් කුමක් අදහස් කරයිද? (ලකුණු 2)
(v) (අ) ඕනෑම ව්‍යාපාර ආයතනයක පොදුවේ හඳුනාගතහැකි ප්‍රධාන ගුණාංග මොනවාද? (ලකුණු 2)
(ආ) හවුල් ව්‍යාපාරයක දක්නට ඇති අවාසිදායක ලක්ෂණ ඉදිරිපත් කරන්න. (ලකුණු 2)

04. (i) (අ) සීමිත පොදු සමාගම් යනු ජනප්‍රිය ව්‍යාපාර සංවිධාන විශේෂයකි. එම සමාගම්වල හිතකර ලක්ෂණ 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) සමුපකාර ව්‍යාපාරය පෞද්ගලික අංශයේ ව්‍යාපාර අතරින් කැපී පෙනෙන ව්‍යාපාර විශේෂයකි. එය වටිනා ප්‍රතිපත්ති කිහිපයක් මත ගොඩනැගී ඇත. එම ප්‍රතිපත්ති 4ක් දක්වන්න. (ලකුණු 2)
(ii) (අ) සමුපකාර ව්‍යාපාරය තම අභිවෘද්ධිය කරා යන ගමනේදී ඇතිවූ නව ප්‍රවණතාවයන්ද ඇත. එවන් ප්‍රවණතා 2ක් නම් කරන්න. (ලකුණු 2)
(ආ) කෙසේ වුවද සමුපකාර ව්‍යාපාරයේද අනෙකුත් ව්‍යාපාරවල මෙන්ම සීමා / අවාසි දැකිය හැකිය. ඉන් 2ක් නම් කරන්න. (ලකුණු 2)
(iii) (අ) සමුපකාරයක් ලියාපදිංචි කිරීමට අවශ්‍යලියවිලි 4ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර රූප සටහනකින් දක්වන්න. (ලකුණු 2)
(iv) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 4ක් නම්කර පැහැදිලි කරන්න (ලකුණු 4)
(v) (අ) ව්‍යවසායකත්වය තුළින් අත්වන සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ 4ක් සඳහන් කරන්න (ලකුණු 2)
(ආ) පහත සඳහන් දෑ පිළිබඳ කෙටියෙන් පැහැදිලිකරන්න.
1. හරිත ව්‍යවසායකත්වය 2. අභ්‍යන්තර ව්‍යවසායකත්වය (ලකුණු 2)

II කොටස

05. (i) (අ) රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු 4ක් දක්වන්න. (ලකුණු 2)
(ii) (අ) ''සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට ව්‍යවසායකත්වය වැදගත්වේ.'' මෙම ප්‍රකාශය සනාථ කිරීමට හේතු 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේදී හා පවත්වාගෙන යාමේදී සැළකිලිමත් වියයුතු කරුණු 4ක් දක්වන්න. (ලකුණු 2)
(iii) ශ්‍රී ලංකා මහ බැංකුව සිය අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඉටුකරනු ලබන කාර්යයන් මොනවාද? (ලකුණු 4)

(iv) (අ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් යනු කුමක්ද? (ලකුණු 2)
(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාර වල ක්‍රියාකාරිත්වයට දායකවන ආකාරය සඳහන් කරන්න. (ලකුණු 2)
(v) (අ) ව්‍යාපාරිකයෙකුට ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ලබාගත හැකි පහසුකම් 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) බැංකු ණය වර්ගකර, කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

06. (i) (අ) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් මගින් ඉටුකරනු ලබන සේවාවන් 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු නම්කර, පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) (අ) සීමාසහිත ලංකා ක්ලියර් (පෞද්) සමාගම විසින් ඉටුකරනු ලබන සේවාවන් 2 දක්වන්න. (ලකුණු 2)
(ආ) චෙක්පතක් පිටසන් කිරීම යනු කුමක්ද? චෙක්පතකට පිටසන් යෙදීමට සිදුවන අවස්ථා 2ක් දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) ණයපතක් මගින් ගනුදෙනුකිරීමෙන් ගනුදෙනුකරුවකුට අත්වනවාසි 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) රක්ෂණ ගිවිසුම යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. රක්ෂණ ගිවිසුමක් ඇතිවීම සඳහා තිබිය යුතු මූලිකාංග නම්කරන්න. (ලකුණු 2)

(iv) රක්ෂණය රටේ ආර්ථික ප්‍රගතියට හා ව්‍යාපාර සංවර්ධනයට බලපාන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(v) (අ) රක්ෂණය ක්‍රියාත්මක වීමට හා අහෝසිවීමට රක්ෂණ මූලධර්ම බලපායි. මෙම රක්ෂණ මූලධර්ම නම් කරන්න. එම මූලධර්මවල සද්භාවය හෙවත් උපරිම විශ්වාසය කඩවිය හැකි ආකාර නම් කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාර ආයතනයක සන්නිවේදනය සිදුවන ආකාරය අනුව සන්නිවේදනය වර්ගකර එම එකිනෙක කොටස් හඳුන්වන්න. (ලකුණු 2)

07. (i) (අ) ඉන්ට්‍රානෙට් (Intranet) යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) සංඥා හා සංකේත මගින් සන්නිවේදනයේ ඇති අවාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) සන්නිවේදනයට ඇතිවන බාධා පිටු දැකීමට ගතහැකි විවිධ ක්‍රම උපාය 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) (අ) සමාජීය, ආර්ථික පමණක් නොව රටක් සංවර්ධනය සඳහා වැදගත් වන්නාවූ ප්‍රධානම යටිතල පහසුකම වන ''ප්‍රවාහනය'' යන්න අර්ථ දක්වන්න. (ලකුණු 2)
(ආ) ප්‍රවාහන පද්ධතිය යනු කුමක්ද යන්න පැහැදිලිකර එහි මූලිකාංග නම් කරන්න. (ලකුණු 2)

(iv) (අ) වර්තමාන රජය මගින් ප්‍රවාහනයේ කාර්යක්ෂමතාවයට හා සංවර්ධනයට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව මහා මාර්ග, දුම්රියමාර්ග, ගුවන්, සමුද්‍ර ආදී ප්‍රවාහන මාර්ග සංවර්ධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දක්වන්න. (ලකුණු 2)
(ආ) සමන් වැවිලි බෝගයක් වන තේ අපනයනය කරන්නාවූ තොග වෙළෙන්දෙකි. ඔහු තම ව්‍යාපාර කටයුතු සඳහා උචිත ප්‍රවාහන ක්‍රමයක් තෝරාගැනීමේදී සලකා බලන සාධක පෙළගස්වන්න. (ලකුණු 2)

(v) (අ) සැපයුම්සේවා පද්ධති දෙකක් නම් කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාර ආයතනයට ප්‍රවාහන හා සැපයුම්සේවා මගින් ලබාගතහැකි වාසි 4ක් නම් කරන්න.(ලකුණු 2)

08. (i) (අ) වෙළෙඳාම කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)
(ආ) වෙළෙඳාම වර්ගකර දක්වෙන ගැලීම් සටහන් අඳින්න. (ලකුණු 2)

(ii) වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදාගැනීම නිසා නිෂ්පාදකයින්ට ලබාගත හැකි වාසි 04 ක් හා අවාසි 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) (අ) මහා පරිමාණ සිල්ලර වෙළෙඳුන් වර්ග 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) වර්තමානයේ සුපිරි වෙළෙඳසැල් ප්‍රසිද්ධියට පත්වී තිබේ. මේ සඳහා බලපා ඇති හේතු මොනවාද? (ලකුණු 2)

(iv) විදේශ වෙළඳාමට සම්බන්ධවීමෙන් රටකට අත්පත්කරගත හැකි වාසි 4ක් හා අවාසි 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(v) (අ) ජාත්‍යන්තර වෙළෙඳාමේ උන්නතිය සඳහා පිහිටවා ඇති ජාත්‍යන්ත සංවිධාන 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) සාර්ක් සංවිධානයට අයත් රටවල් 8 සඳහන් කරන්න. (ලකුණු 2)

තෙවන වාර පරීක්ෂණය - 2018
12 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
I පත්‍රය

01) - 4	(11) - 3	(21) - 3
(02) - 2	(12) - 5	(22) - 2
(03) - 1	(13) - 4	(23) - 4
(04) - 2	(14) - 4	(24) - 4
(05) - 3	(15) - 3	(25) - 5
(06) - 4	(16) - 2	(26) - 5
(07) - 3	(17) - 4	(27) - 4
(08) - 5	(18) - 4	(28) - 3
(09) - 4	(19) - 4	(29) - 5
(10) - 3	(20) - 2	(30) - 3

31. (අ) කාර්මික භාණ්ඩ/ව්‍යාපාර භාණ්ඩ (ආ) භාණ්ඩ, සේවා
32. (අ) පීඩන කණ්ඩායම් (ආ) යෙදවුම්, නිමවුම්
33. (අ) මානව අයිතීන්, සේවක අයිතීන්, පරිසර ආරක්ෂාව, ප්‍රජා සේවා
(ආ) භාණ්ඩ හා සේවා පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම, මිල හා වෙනත් කටයුතු පොරොන්දු පරිදි ඉටුකිරීම, ගුණාත්මක භාණ්ඩ සැපයීම වැනි ඒවායින් දෙකකට ලකුණු දෙන්න.
34. (අ) ISO - 14001. ISo - 27000 (ආ) ආදායම් බදු, සමාගම් ලාභ බදු
35. විදේශීය සමාගම්, බහුජාතික සමාගම්
36. (අ) 1. නිර්මාණශීලීව 2. නවෝත්පාදන (ආ) නව්‍යතා
37. (අ) 1. මූල්‍යමය දිරිගැන්වීම 2. මූල්‍යමය නොවන දිරිගැන්වීම් (ආ) සහන්‍යා
38. (අ) ආන්තික සැපයුම්කරුවන්/ සාධ්‍යකරණ ආයතන
(ආ) ජගත් අන්තර්බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය/ස්විෆ්ට් සන්නිවේදන ජාලය
39. (අ) ජීවිත හා දේපළ (ආ) දේපළ
40. (අ) තොග හා සිල්ලර වෙළඳාම (ආ) ආනයන අපනයන වෙළඳාම
41. 1. පතල් හා කැනීම් 2. නිමැවුම් කර්මාන්ත 3. ඉදිකිරීම් 4. විදුලිය ජලය හා ගෑස්
42. 1. ISO 14001 2, ISO 9001 3. ISO 27000 4. ISO 22000
43. 1. Refuse - ප්‍රතික්ෂේප කිරීම. 2. Reuse - නැවත භාවිතා කිරීම.
2. Recycle - ප්‍රතිචක්‍රීකරණය 4. Reduce - අවම කිරීම.
44. 1. ගනුදෙනුකරුවකු ලෙස 2. යටිතල පහසුකම් සපයන්නෙකු ලෙස
3. නියාමකයකු ලෙස 4. බදු අයකරන්නෙකු ලෙස 5. තරඟකරුවෙකු ලෙස
45. 1. පුද්ගලයින් සිටීම 2. අරමුණක් තිබීම
3. සංවිධාන ව්‍යුහයක් පැවැතීම. 4. අනන්‍යතාවය සඳහා නමක් කිරීම
46. ප්‍රාග්ධනය අඩුවීම - නිල ලැයිස්තුගත සමාගමක් බවට පත්කළ නොහැකිවීම.
නිදහසේ කොටස් පැවරීම බාධා පැවැතීම. - සාමාජික සංඛ්‍යාව උපරිම 50 කට සීමා වීම.
47. - නායකත්ව කුසලතා - අන්තර් පුද්ගල කුසලතා - සන්නිවේදන කුසලතා - මූලික කළමනාකරණ කුසලතා
48. 1. ටෙලර් කාඩ්පත් භාවිතයෙන් ගිණුමෙන් මුදල් ආපසු ලබාගත හැකිවීම.
2. ගිණුමට මුදල් තැන්පත් කළහැකිවීම.
3. ගිණුමෙන් ගිණුමට මුදල් මාරුකරගත හැකිවීම.
4. ගිණුමේ ශේෂය දැනගතහැකිවීම.
5. බිල්පත් ගෙවීමේ පහසුකම් තිබීම.

49. 1. රාජ්‍ය ණය කළමනාකරණය 2. විදේශ විනිමය පාලනය
3. කුඩා ව්‍යාපාර මූල්‍යකරණ වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.
4. සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය

50. B 2 B ව්‍යාපාර වලින් ව්‍යාපාරවලට
C 2 C පාරිභෝගිකයින්ගෙන් පාරිභෝගිකයාට
B 2 C ව්‍යාපාරවලින් පාරිභෝගිකයාට
G 2 B රජයෙන් ව්‍යාපාරවලට
G 2 C රජයෙන් පාරිභෝගිකයින්ට

II - කොටස

01. 01. (i) (අ) එකග වේ. (ලකුණු 1/2)

1. මිනිසාගේ වුවමනා සපුරාලීම සඳහා ව්‍යාපාර බිහිවී ඇති බව.
2. මිනිසාට ක්‍රය ශක්තිය ලබා දෙන්නේ ව්‍යාපාර බව.
3. මිනිසාම රැකියා අවස්ථා ජනිත කිරීම.
4. නවෝත්පාදන තුළින් මිනිසාට උසස් ජීවන තත්වයක් ලඟාකර දීම.
5. සමාජ වගකීම ඉටුකිරීමෙන් සමාජයට විශාල දායකත්වයක් සැපයීම.

(කරුණකට 3 ක් ඇතුළත් පිළිතුරට 3x1/2 = 11/2)

(ආ) ව්‍යාපාර ආයතනයක දැක්ම (Vision) මෙහෙවර (mission), ඉලක්ක පරමාර්ථ ප්‍රතිපත්ති (Policies) යනාදිය ව්‍යාපාර අපේක්ෂාවන්.

(කරුණු 4ට ලකුණු 1/2 බැගින් ලකුණු 2, කරුණු 3ක් නම් ලකුණු 1 යි)

(ii) (අ) ඍජු සේවාවකි. (ලකුණු 2)

(ආ)

භාණ්ඩ	සේවා
1. ස්පර්ශ කළ හැක.	ස්පර්ශ කළ නොහැක.
2. නිෂ්පාදකයාගෙන් වෙන්කළ හැක.	නිෂ්පාදකයාගෙන් වෙන්කළ නොහැක.
3. පාරිභෝජනය හා නිෂ්පාදනය අවස්ථා දෙකකදී සිදුවේ.	පාරිභෝජනය හා නිෂ්පාදනය එකවර සිදුවේ.
4. විවිධත්වයක් නැත. ගබඩාකළ හැකිය.	විවිධත්වයක් ඇත. ගබඩාකළ නොහැක.

(කරුණු 4ට ලකුණු 1/2 බැගින් ලකුණු 2)

(iii) (අ) ගණුදෙනුකරු → අවශතා වුවමනා → නිෂ්පාදිතය → ලාභය

(ඉහත කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු 2යි, කරුණු 3ක් හෝ 2ක් නම් ලකුණු 1)

(ආ) **නිෂ්පාදයට**

1. කම්හල් බිහිවීම.
2. සුළු පරිමාණ නිෂ්පාදන මහා පරිමාණවීම.
3. අත්යන්ත්‍ර භාවිතය වෙනුවට දියුණු උපකරණ භාවිතය
4. දියුණු ශිල්පීය ක්‍රම භාවිතය (කරුණකට 1/2 බැගින් කරුණු 2ට ලකුණු 1යි)

වෙළෙඳාමට :

1. කිරුම් මිනුම් උපකරණ බිහිවීම. 2. ගබඩා කිරීමේ නව ක්‍රම බිහිවීම.
3. දේශීය වෙළඳාම පුළුල් වීම. (කරුණකට 1/2 බැගින් කරුණු 2ට ලකුණු 1යි)

(iv) (අ) අයිතිකරුවෝ, කළමණාකරුවෝ, සේවකයෝ, ණයහිමියෝ, සැපයුම්කරුවෝ, විභව ආයෝජකයෝ, රජය, ප්‍රජාව) (කරුණු 2කට 1/2 බැගින් කරුණු 8ට ලකුණු 2යි)

(ආ) **ගණුදෙනුකරුවෝ :** 1. අදාළ භාණ්ඩ හා සේවා සඳහා වෙළෙඳපොළ සුරක්ෂිත කරගැනීමට.
2. ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතීත්වය ඇතිකර ගැනීමට.

ණයහිමියෝ : 1. අඛණ්ඩව අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගැනීමට.
2. අඩු පිරිවැයකින් අරමුදල් සම්පාදනය කර ගැනීමට

රජය : 1. බදු සහන ලබාගැනීමට. 2. යටිතල පහසුකම් ලබාගැනීමට.

අයිතිකරුවෝ : 1. ආයෝජන වැඩිකර ගැනීමට 2. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරුකර ගැනීමට

සේවකයෝ : 1. සේවක කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීමට.
2. සේවකයන් රඳවා තබාගැනීමට.

(v) (අ)

පරිසරය සාධකය	ශක්තීන්	දූර්වලතා
අයිතිකරුවන්	1. වැඩි සංඛ්‍යාවක් සිටීම.	සංඛ්‍යාත්මකව කුඩාවීම.
	2. මූල්‍ය ශක්තීන් වැඩිවීම.	මූල්‍ය ශක්තීන් හීනවීම.
කළමණාකරුවන්	1. නිවැරදි තීරණ ගැනීමේ හැකියාව	වැරදි තීරණ ගැනීම
	2. පුහුණුව හා පළපුරුද්ද වැඩිවීම.	තීරණ ගැනීමට පසුබට වීම.
සේවකයන්	1. දක්ෂ පළපුරුදු සේවකයන් සිටීම	නුපුහුණු සේවකයන් සිටීම.
	2. විවිධ හැකියාවන්ගෙන් යුක්ත වීම.	වගකීමෙන් හා වගවීමෙන් තොරවීම.

(කරුණු 4කට 1/2 බැගින් ලකුණු 2යි.)

(ආ) **දේශපාලන හා නෛතික පරිසරය :**

ව්‍යාපාරිකයන්ට හිතකර නීතිරීති පැනවීමෙන් ව්‍යාපාරයට අවස්ථා උදාවන අතර, ව්‍යාපාරිකයන්ට අහිතර නීතිරීති පැනවීමෙන් ව්‍යාපාරවලට තර්ජන වලට මුහුණ දීමට සිදුවේ.

ආර්ථික පරිසරය :

පොළී අනුපාතය අඩුවීම නිසා ණය ගැනීම වැඩිවී ව්‍යාපාර අවස්ථා උදාවේ. එසේම පොළී අනුපාතය වැඩි වීම නිසා ණය ගැනීම සීමා වන අතර ව්‍යාපාරවලට තර්ජනවලට මුහුණදීමට සිදුවේ.

(සුදුසු පිළිතුරු දෙකකට 2 x 1 = 2යි)

02. (i) (අ) නිෂ්පාදන ක්‍රියාවලියේ එක් එක් කොටස් වෙන්කර සේවකයන්ට පැවරීම ශ්‍රම විභජනය ලෙස හැඳින්වේ. ඒ ඒ සේවකයාට පැවරුණු කාර්යය දිගින් දිගටම කළවිට ඒ පිළිබඳව හොඳ නිපුණත්වයක් ලැබේ. එය විශේෂීකරණය ලෙස හැඳින්වේ. ශ්‍රම විභජනය මත විශේෂීකරණය රඳා පවතී.

(පැහැදිලි කිරීමට ලකුණු 2යි)

(ආ) අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝණය නොකරමින් වර්තමාන අවශ්‍යතා ලඟාකරගන්නා වූ සංවර්ධනයකි. (ලකුණු 2)

(ii) (අ) 1. නිෂ්පාදන ක්‍රියාවලියේදී අමුද්‍රව්‍ය, බලශක්ති ජලය, වැනි සම්පත් සුරකිමින් කටයුතු කිරීම.
2. පරිසර හිතකාමී දෑ මිලට ගැනීම.
3. පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය.
4. ජලය, වාතය, පස දූෂණය අඩුකිරීම.
5. පාරිසරික නීතිරීතිවලට අනුගතව කටයුතු කිරීම.

(කරුණු 4කට ලකුණු 1/2 බැගින් ලකුණු 2යි)

(ආ) නිවැරදිව ගොඩනගා ඇති නිර්වචනයකට ලකුණු 2ක් දෙන්න.

(iii) ආර්ථික තිරසර සංවර්ධනය, පරිසර තිරසර ආරක්ෂණය, සමාජ තිරසර සංවර්ධනය (ලකුණු 1)

1. ආර්ථික තිරසාර සංවර්ධනය :
ආර්ථික වර්ධනය හා සමගාමීව ජනයාගේ ජීවන තත්වයද උසස් මට්ටමකට ගෙන ඒම.
2. පරසර තිරසාර සංවර්ධනය :
මිනිසා හා පරිසරය අතර පවත්නා මනා සමබරතාව පවත්වාගෙන යාම.
3. සමාජ තිරසර සංවර්ධනය :
විෂමතාවලින් තොර සමානාත්මතාවයෙන් යුතු ජනතාවක් බිහිකිරීම.

(iv) (අ) ව්‍යාපාරය විසින් සමාජයට ආපසු ලබාදෙන දෑ මෙවන් පිළිතුරකට ලකුණු 2ක් දෙන්න.

(ආ) කීර්තිනාමය වර්ධනය වීම, ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සමාජයෙන් සහය ලැබීම. රජයේ බලපෑම් අවම වීම. ව්‍යාපාර අංශ අතර අන්තර් රැඳියාව වර්ධනය වීම. (ලකුණු 2)

(v) (අ) රටක පුළුල් මුදල් සැපයුම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කරන ප්‍රතිපත්තියයි.

(ආ) 1. ව්‍යාපාරවල පිරිවැය ඉහළ යාම.
2. නිෂ්පාදිත ඵල මිල ඉහළයාම නිසා ගනුදනුකරුවන් අහිමිවීම.

03. (i) (අ) වාණිජ බැංකුවල ඇති තැන්පතුවලත් මහා බැංකුවේ සංචිත ගිණුම්වල තැම්පත් කල යුතුයැයි මහා බැංකුව නියමකරනු ලබන අනුපාතය.

(ආ) ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය. තොරතුරු දැනගැනීමේ අයිතිය.
තෝරාගැනීමට ඇති අයිතිය. සවන් යොමුකරවා ගැනීමේ අයිතිය.

(ii) (අ) SLS, ISO 2001 - 2008, ISO 22000, GMP

(ආ) 1. නිෂ්පාදන පිරිවැය පහත යාම නිසා කාර්යක්ෂමතාව ඉහළ යාම.
2. භාණ්ඩ හා සේවා වල මිල පහළ යාම.
3. දේශීය භාණ්ඩවලට විදේශ ඉල්ලුම ඉහළයාම.
4. ජනතාවගේ ජීවනතත්වය ඉහළයාම.

(iii) 1. ව්‍යවසායකයන් අතර ඇති සීමාකාරී ගිවිසුම් පාලන.
2. තරග විරෝධී චර්යා පාලනය
3. භාණ්ඩ හා සේවා සපයන්නන් අතර ඵලදායී තරගය ප්‍රවර්ධනය
4. භාණ්ඩ හා සේවා පාරිභෝජනය සම්බන්ධව පාරිභෝගිකයින් දැණුවත් කිරීම.
5. පාරිභෝගික සංවිධාන පිහිටවීම ප්‍රවර්ධනය හා උපකාර කිරීම.

(iv) (අ)



(ලකුණු 2)

(ආ) බාහිර පාර්ශවය වෙත ව්‍යාපාරය වශයෙන් හෝ අයිතිකරු වශයෙන් වන බැඳීමකි. නීතියේදී බාහිර වගකීම් පියවීමට යොදවා ඇති ප්‍රාග්ධනයේ ප්‍රමාණයට පමණක් සීමිත වන සමාගම්. (ලකුණු 2)

(v) (අ) අනන්‍යාවය නමක් පැවතීම, අරමුණු පැවතීම, බලතල බෙදී යාමේ ව්‍යුහයක් පැවතීම, සීමාවන් අර්ථ දක්වීමට හැකිවීම. (ලකුණු 2)

(ආ) * තීරණ ගැනීම් ප්‍රමාද වීම.
* එක් හවුල්කරුවකුගේ දුර්වලතා මුළු ව්‍යාපාරයටම බලපෑම.
* ලාභය බෙදීයන හෙයින් ලාභ කොටස කුඩා වීම. * ගැටුම් වලට පෙළඹීම.

04. (i) (අ) වගකීම සීමිත වීම, නෛතික පුද්ගලභාවයක් පැවතීම, විශාල ප්‍රාග්ධනයක් රැස්කරගතහැකි වීම, ණය ලබාගැනීමට පහසු වීම. (ලකුණු 2)

(ආ) ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, සහභාගිත්වය අනුව ප්‍රතිලාභ, ස්වෛරීභාවයය හා නිදහස (ලකුණු 2)

(ii) (අ) 1. ස්වයංසේවා වෙළඳසැල් ආරක්ෂා කිරීම. 2. නව ව්‍යාපාර අවස්ථා හඹා යෑම.
3. ඉලෙක්ට්‍රොනික් ගෙවීම් පහසුකම් හඳුන්වාදීම. (ලකුණු 2)

(ආ) ප්‍රතිපත්ති මතම පිහිටා කටයුතු කිරීම. ප්‍රාග්ධනය සීමිත වීම. (ලකුණු 2)

(iii) (අ) ලියාපදිංචි කිරීමේ අයදුම්පත, අතුරු ව්‍යවස්ථා පිටපත් 2, ආර්ථී යෝග්‍යතාව පිළිබඳ වාර්තාව, මාර්ග සිතියම. (ලකුණු 2)

(ආ)

නව්‍යතා සොයා ගැනීම
↓
සංකල්ප ගොඩ නැගීම හා ව්‍යාපාර සැළැස්ම
↓
අවශ්‍ය සම්පත් සම්පාදනය
↓
යථාර්ථයක් බවට පත්කර ගැනීම.
↓
ප්‍රතිලාභ ලැබීම

(පියවර අනුපිළිවෙළින් දක්වීමට ලකුණු 2)

(iv) * අවදානම් දැරීමට ඇති කැමැත්ත හා ව්‍යවසායකයා අවදානම් වලට මුහුණදීමට කැමැත්ත දක්වයි. නමුත් ඕනෑම අවදානමකට මුහුණදීමක් මින් අදහස් නොකෙරේ.
* සමාජශීලීබව : වෙනස් ආකාරකට දැකීම, සිතීම හා ක්‍රියා කිරීම.
* කැපවීම : තම අරමුණු ඉටුවන තෙක්, තමන් කරන කාර්යය දැඩි උනන්දුවකින් යුතුව සිදු කිරීම.
* ආත්ම විශ්වාසය : ව්‍යවසායකයෙකුට විවිධ ගැටලු වලට මුහුණදීමට සිදුවන අතර, ඒවාට සාර්ථකව මුහුණ දී එම ගැටළු පිටු දැකීමට හැකිය යන විශ්වාසයයි.
* ස්වාධීන බව : වෙනත් අයගේ අදහස් මත යැපෙන්නකු නොවී තමන්ගේ අදහස් හා හැකියා හැකිතරම් දුරට ක්‍රියාත්මක කිරීමට ඇති කැමැත්තයි. (කරුණු 4ක් නම්කර පැහැදිලි කිරීමට ලකුණු 4යි)

(v) (අ) * නව රැකියා උත්පාදනය වීම. * ආදායම් අවස්ථා බිහිවීම. * නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදාවීම. * ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම. * ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම. * ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදාගැනීම. * නව වෙළඳපොළවල් සංවර්ධනය වීම.
(කරුණු 4ට ලකුණු 2)

(ආ) හරිත ව්‍යවසායකත්වය යනු පාරිසරික හෝ සමාජීය ගැටලු හෝ අවශ්‍යතා සඳහා ඉතා ඉහළ අවදානමකින් යුතුව ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීමට ව්‍යවසායකත්ව අදහස් මගින් දැනුවත් භාවයකින් යුතුව කරනු ලබන ක්‍රියාකාරකම්ය.
අභ්‍යන්තර ව්‍යවසායකත්වය යනු සංවිධානවල විවිධ තනතුරුවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයන් තම ආයතනවල නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රමවල වෙනස්කම් සිදුකරන අතර, ඉහළ කළමණාකරුවන් තම නිර්මාණශීලී කටයුතු කිරීම සඳහා එවැනි පුද්ගලයන් දිරිගන්වයි. මේ ආකාරයට සංවිධානය වෙනස්කම් හඳුන්වා දෙන ආයතනයක් තුළ ක්‍රියාත්ම ව්‍යවසායක්වයයි.
(නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 2)

05. (i) (අ) * සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශ්‍රම සූක්ෂම කර්මාන්ත නිසා වැඩි රැකියා ප්‍රමාණයක් සැපයිය හැකිය. * ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායකවීම. * දේශීය සම්පත් භාවිත කිරීම. * ප්‍රාදේශීය සංවර්ධනය හේතුවෙන් නාගරීකරණය නිසා ඇතිවන ගැටළු අවම වීම. * ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවම වීම. * මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අමුද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය ලබාදීම. * මහා පරිමාණ ව්‍යාපාර ඉටු නොකරන ව්‍යාපාර කටයුතු වල නිරත වීම.

(ආ) * මූල්‍ය ගැටළු. * වෙළඳපොළ තරඟකාරිත්වයට මුහුණදීමට අපහසුවීම. * කළමණාකරණයේ දුර්වලතා. * ව්‍යවසායකත්ව හැකියා අඩුවීම. * යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම. * නව තාක්ෂණික දැනුම අඩුතම හා නව තාක්ෂණික දැනුම යොදා නොගැනීම. (කරුණු 4ට ලකුණු 2)

(ii) (අ) *ව්‍යාපාර ඇරඹීම අවදානම් සහගතය. එහෙත් ව්‍යවසායකයා තුළ ඇති අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාවන් තුළින් එය අවම කරගත හැකිය.
* ව්‍යවසායකයා කැපවීමේ හා උනන්දුවෙන් කටයුතු කරයි. ඒමත ව්‍යාපාරය බොහෝ දුරට සාර්ථක වේ. * ව්‍යවසායකයා තුළ ඇති ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය කුඩා ව්‍යාපාර සාර්ථක වීමට බලපායි. * ව්‍යවසායකයා ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කරගැනීමට කටයුතු කිරීමෙන් ව්‍යාපාර සාර්ථක කරගත හැකිය. (කරුණු 4ට ලකුණු 2)

(ආ) * තම හැකියා හා කුසලතා පිළිබඳ අධ්‍යයනය කිරීම. * නිෂ්පාදිතයට ඇති වෙළෙඳපොළ හා එම වෙළෙඳපොළට ලඟාවිය හැකිද යන්න. * ආරම්භක ප්‍රාග්ධනය හා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය පිළිබඳව අධ්‍යයනය කිරීම. * සංවිධාන ක්‍රමය පිළිබඳව අධ්‍යයනය. *ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳව පවතින නීතිරීති. * පවතින තරඟකාරිත්වය. (කරුණු 4ට ලකුණු 2)

(iii) *මුදල් ප්‍රතිපත්ති මෙහෙයවීම. * විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙයවීම. * ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය. * ව්‍යාවහාර මුදල් නිකුත්කිරීම හා බෙදා හැරීම. * බැංකු හා බැංකු නොවන ආයතනවල අධීක්ෂක ලෙස කටයුතු කිරීම. * රජයේ ආර්ථික උපදේශක, බැංකුකරු සහ මූල්‍ය නියෝජිතයා වශයෙන්කටයුතු කිරීම. * මහබැංකුවේ පියවීම්ගිණුම් පවත්වාගෙන යන වාණිජ බැංකු වලට සහ ප්‍රාථමික වෙළෙඳුන්ට නිශ්කාශ්‍ය සහ පියමේ පහසුකම් සැපයීම.
කරුණු 7 ම ඇත්නම් ලකුණු 04 යි.
කරුණු 6, 5 ක් නම් ලකුණු 3 යි.
කරුණු 4,3 ක් නම් ලකුණු 2 යි.
කරුණු 2 ට ලකුණු 1 යි.
කරුණු 1 ට ලකුණු නැත

(iv) (අ) බැංකුපනත යටතේ විශේෂිත බැංකුවක් ලෙස කටයුතු කරගෙන යාමට මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබාගෙන ඇති ආයතන විශේෂයකි. (ලකුණු 2)

(ආ) * කාලීන හා ඉතිරි කිරීමේ තැන්පත් භාර ගැනීම. * විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ට ණය සැපයිම. * සමාගම්වල කොටස් ප්‍රාරක්ෂණය කිරීම. * කල් බදු පහසුකම් සැපයීම. * කළමනාකරුණ උපදේශන සේවා සැපයීම.

(v) (අ) * චෙක්පත් වලින් ගෙවීම්කළහැකිවීම * ප්‍රේෂණ පහසුකම් ලබාගත හැකිවීම. * නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම. * අයිරා පහසුකම්ලබාගත හැකිවීම. * බැංකු සමග' කළ ගනුදෙනුවල වාර්ත.ාවක් ලබාගත හැකිවීම. (බැංකු ගිණුම් ප්‍රකාශය) (කරුණු 4ට ලකුණු 2)

(ආ) * ව්‍යාපාරික ණය * පාරිභෝගික ණය (ලකුණු 1)
ව්‍යාපාරික ණය : පුද්ගලයෙකුට හෝ ආයතනයකට තම ව්‍යාපාරිකකටයුතු සඳහා කෙටිකාලීනව, මධ්‍යකාලීනව හා දිගුකාලීනව අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීමයි.
පාරිභෝගික ණය : වත්කම් මිලට ගැනීමට හා හදිසි ආපදාවලදී පිරිමසා ගැනීමට හා හදිසි ආපදාවලදී පිරිමසා ගැනීමට පාරිභෝගිකයින්බැංකුව විසින් සපයන ණය වේ. (පැහැදිලි කිරීමට ල. 1යි)

06. (i) (අ) * නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාර ව්‍යාප්තකිරීම, ව්‍යාපාර පවරා ගැනීම හා මිලදී ගැනීමේදී අරමුදල් සැපයීම.
* කොටස් ප්‍රාරක්ෂණය. * ණය සම්මේලනය. * ව්‍යාපාර වලට සම්බන්ධ වෙනත් සේවා සැපයීම. (කරුණු 4කට ලකුණු 2)

(ආ) 1. ආර්ථික හා මිල ස්ථායිතාවපවත්වාගෙන යාම.
2. මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වාගෙන යාම. (කරුණු 2ට ලකුරුණු 1)
* ව්‍යාපාර මුදලේ දේශීය හාවිදේශීය අගය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම ආර්ථික හා මිල ස්ථායිතාවයි. * ආයෝජනයන් හා ආර්ථික වර්ධනයන් පවත්වා ගනිමින් ආර්ථිකයේ ඔරොරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමසඳහා සමස්ථ මූල්‍ය පද්ධතිය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවයයි. (කරුණු 2 පැහැදිලි කිරීමට ලකුණු 1)

(ii) (අ) * චෙක්පත් හා අණකර හුවමාරුව හා ශුද්ධ ශේෂය ගණනය කිරීම.
* එම ශුද්ධ ශේෂ මහ බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු වෙත දැනුම් දීම.(කරුණු 2 ට ලකුණු 2 යි)
(ආ) * චෙක්පතෙහි මුහුණත සඳහන් වන ආකාරයටම ආදායකයා සිය තම චෙක්පත පිටුපස ලිවීමයි.
(ලකුණු 1යි)
* ආදායකයා විසින් චෙක්පත බැංකුවේ තැන්පත් කිරීමේදී
* විධාන චෙක්පතක් නම් අන් අයෙකුට පවරන අවස්ථාවේදී.
* රේඛණය නොකරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේදී.(කරුනු 2ට ලකුණු 1)

(iii) (ආ) * ණයපත් මගින් මුදල් ලබාගැනීමට ගිනුමක් තිබීම අවශ්‍ය නොවීම. * යම්කාල සීමාවක් දක්වා පොලී රහිත ණයක් වීම. * අනුමත සීමාව තුළ ATM යන්ත්‍ර මගින් මුදල් ලබාගත හැකිවීම. * වට්ටම් හා ප්‍රසාද ලකුණු හිමිවීම. (කරුනු 4ට ලකුණු 2යි)
(ආ) රක්ෂණ ආවරණ ඉල්ලාසිටින රක්ෂිතයා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක් රක්ෂණ ආයතනය විසින් පිළිගැනීමෙන් පසු දෙපාර්ශවය අතර ඇතිකරගන්නා ලිඛිත එකඟතාවයයි.
මූලිකාංග : 1. නෛතික බැඳීම ඇතිකරගන්නා අදහස. 2. අර්පනය හෙවත් යෝජනාව. 2. ප්‍රතිග්‍රහනය හෙවත් පිළිගැනීම. 4. ප්‍රතිශ්ඨාව හෙවත් මුදල්අගයක් තිබීම. 5. ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීම් ඇතිකරගැනීමේ හැකියාව. 6. නීතිමය එකඟ බව.
(ගිවිසුමවිස්තර කිරීමට ලචුණු 1යි. මූලිකාංගනිවැරදිව නම්කිරීමට කරුණු 3ට 1/2 බැගින් 6ට ලකුණු 1යි)

(iv) **රටේ ආර්ථිකයට**
*විවිධ රක්ෂක ක්‍රම හඳුන්වාදීමමගින් ව්‍යාපාර කටයුතු පුළුල්වීම හා එය ජාතික නිෂ්පාදිතයට දායකවීම.
* මූල්‍ය වෙලෙඳපොළ පුළුල් වීම.. * රක්ෂණ කටයුතු හා සම්බන්ධ විශාල ප්‍රමාණයට රැකියා බිහිවීම.
* රක්ෂණ සමාගම් රජයේ විවිධ සුරකුම්පත්වල ආයෝජනය.
ව්‍යාපාර ප්‍රගතියට :
විවිධ වූ අවධානම් වන ගිනි ගැනීම්, ජල ගැනීම්, කැරලි කෝලාහල, සොරසතුරු උවදුරු, මූදු උවදුරු, රථවාහන උවදුරු, නිෂ්පාදනාගාරවල ඇතිවන උවදුරු ආදියට හූණදීමට සිදුවේ. මෙම අවදානම් ආවරණය සඳහා විවිධ ඔප්පු හඳුන්වාදීම් ඇති බැවින් ව්‍යාපාර අවදානම් වලට මූණ දුන්නත් අඛණ්ඩව කරගනයාමට රක්ෂණය හේතු වී ඇත. (කරුනු නම්කිරීමට ලකුණු 2 විස්තර කිරීමට ලකුණු 2)

(v) (අ) රක්ෂණ හිමිකම, උපරිම විශ්වාසය, හාණිපූරණය, ආසන්නතම හේතුව
කඩවිය හැකි අවස්ථා : * අදාළ තොරතුරු අනාවරණය / හෙළිදරව් නොකිරීම.* වංචනික දූර්නිරූපණය * හිතාමතා කරුණු වසන්කිරීම. * අහිසංක දූර්නිරූපනය (අහිංසක කම නිසා කරුණු වෙනස්කිරීම) (කරුණු 4 නම්කිරීමට ලකුණු 1/2 බැගින් ලකුණු 2)
(ආ) * අභ්‍යන්තර සන්නිවේදනය * බාහිර සන්නිවේදනය. (කරුණු 2 දැක්වීමට ලකුණු 1)
අභ්‍යන්තර සන්නිවේදනය යනු : ව්‍යාපාර ආයතනය තුළ විවිධ පාර්ශව අතර තොරතුරු හුවමාරු කරගැනීමයි.
බාහිර සන්නිවේදනය යනු : ව්‍යාපාර ආයතනය ඉන් බාහිර පාර්ශව හා ආයතන සමග තොරතුරු හුවමාරු කරගැනීමයි. (පැහැදිලි කිරීමට ලකුණු 2යි)

07. (i) (අ) එක් පුද්ගලයෙකු හෝ ආයතනයක් සතුවන හා පරිපාලනයට ලක්වන අන්තර්ජලාය ද පදනම් කරගන්නා නමුත් ආයතනය තුළ අවසරලත් පාර්ශවයන්ට පමණක් එහි තොරතුරු වලට ප්‍රවේශ වීමට ඉඩ සලසන පරිගණක ජාල ඉන්ට්‍රානෙට් වේ. (පැහැදිලි කිරීමට ලකුණු 2යි)
(ආ) * දෘෂ්ටි ගැටළු හා ඌණතා ඇති පාර්ශව සමග තොරතුරු හුවමාරුවේදී ගැටලු ඇතිවිම.
* සංඥා සංකේත විකෘති වී යාමෙන් තොරතුරු සන්නිවේදනයට බාධා ඇතිවීම.
* සමහර සංඥා හා සංකේත අවබෝධ කරගැනීමට අපහසුවීම.
* සංඥා හා සංකේත අවබෝධ කරගැනීමට පෙර ඒවා පිළිබඳ දැනුම අවශ්‍ය වීම.
(කරුණු 2 ලකුණු 2)
(ii) * නව සන්නිවේදන උපකරණ භාවිතා කිරීම. * සන්නිවේදනය පිළිබඳ විවිධ නීතිරීති පැනවීම.
* සන්නිවේදන කුළුණු පිහිටුවීම. * ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීම.
* සන්නිවේදන ක්‍රම අවභාවිතය පිළිබඳ නව නීතිරීති සම්පාදනය
(කරුණු 4 ලකුණු 4 කරුණු 3 කට ලකුණු 2යි)

(iii) (අ) එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට විවිධ වූ මාධ්‍යයන් භාවිතා කරමින් පුද්ගලයින් හෝ ද්‍රව්‍ය ගෙනයාමේ භෞතික ක්‍රියාවලියයි. එමෙන්ම අවකාශය තරණය කිරීම ප්‍රවාහනය ලෙසද දැක්වේ.
(මෙම අදහස ඇති පිළිතුරට ලකුණු 2)

(ආ) ප්‍රවාහනයේ සංවර්ධනයට සමබරතාවයකින් සැදුම්ලත් සියළු ප්‍රවාහන මූලිකාංග වැදගත්වේ. මේවා සමබර සංවර්ධනයෙන් සැදුනාවූ අංගයන් සියල්ලේ එකතුව ප්‍රවාහන පද්ධතියයි.
මූලිකාංග : 1. මාර්ගය 2. මාධ්‍ය 3. බලය 4. පර්යන්තය
(කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 1යි විස්තරයට ලකුණු 1යි)

(iv) (අ)

මහාමාර්ග	දුම්රිය මාර්ග	සමුද්‍ර මාර්ග	ගුවන්
* මාර්ග නවීකරණය * කොන්ක්‍රීට්, අධිවේග හා උමං මාර්ගී	* දුම්රිය මාර්ග ප්‍රතිසංවිධානය * විශේෂ මැදිරි යෙදීම * දුම්රිය මාර්ග දිගුකිරීම.	* වරාය ඉදිකිරීම * වරාය සංවර්ධනය කිරීම	* ගුවන් තොටුපල සංවර්ධනය * ගුවන්ගමන් සහන ඇතිකිරීම. * ගුවන් තොටුපල ඉදිකිරීම.

(එක් එක් ප්‍රවාහන මාර්ග සඳහා කරුණු 2 බැගින් ඉදිරිපත්කර ඇතිනම් ලකුණු 2යි. කරුනු 2කට 1/2 බැගින්)

(ආ) 1. භාණ්ඩයේ ස්වභාවය 2. දුර 3. වේගවත් බව 4. සුරක්ෂිත බව 5. පිරිවැය
6. ධාරිතාව 7. සුළබතාව 8. අන්තර්ජාතික ප්‍රමිති
(නම්කර ඇතිනම් ලකුණු 2 කරුනු 2කට ලකුණඅ 1/2 බැගින්)

(v) (අ) 1. සමබර ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති.
2. නිෂ්පාදන ක්‍රියාවලි දක්වා ප්‍රවාහන සංකීර්ණ වූ පද්ධති.
3. නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත්කිරීම සඳහා වූ සංකීර්ණ වූ පද්ධති
4. නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහන සහිත පද්ධති.

(ආ) 1. අඛණ්ඩ වූ පාරිභෝගික වුවමනා ඉටු කිරීමට හැකිවීම.
2. තරඟකාරිත්වයට සාර්ථකව මුහුණදියහැකිවීම.
3. ගුණත්වයෙන් යුතු භාණ්ඩ නිපදවිය හැකිවීම.
4. කාලය හා පිරිවැය අවම වීම.

08. (i) (අ) නිෂ්පාදිත මිලට ගැනීම හා විකිණීම සම්බන්ධ කාර්යයන් හෝ භාණ්ඩ හා සේවා මුදල් පදනම්කරගෙන හුවමාරු කිරීමේ ක්‍රියාවලිය.

(ආ)



(ii)

වාසි	අවාසි
1. භාණ්ඩ බෙදාහැරීම පහසුවීම.	1.අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇතිකිරීම.
2. භාණ්ඩ හඳුන්වාදීම පහසුවීම	2. වෙළඳපොළ පාලනයට ඇති බලය අහිමිවීම.
3. වෙළෙඳපොළ තොරතුරු පහසුවෙන් ලබාගත හැකිවීම.	3. භාණ්ඩ වල මිල ඉහළයාම.
4. වෙළඳපොළ ප්‍රසාරණය	4. පාරිභෝගිකයා සමග සම්බන්ධතා අඩුවීම.

(iii) (අ) 1. සුපිරි වෙළෙඳසැල් 2. බැඳි වෙළෙඳසැල් 3. නානාංග වෙළඳසැල් 4. වෙළෙඳ සංකීර්ණ
(ආ) 1. ස්වයං සේවා ක්‍රමය පැවතීම. 2. ඉහළ පාරිභෝගික සේවා 3. විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය
4. වාහන නැවැත්වීමේ පහසුකම් තිබීම. 5. දෛනිකව අවශ්‍ය භාණ්ඩ එකම ස්ථානයක තිබීම.

(iv)

වාසි	අවාසි
1. රටතුළ නිපදවිය නොහැකි භාණ්ඩ භාවිතයට හැකිවීම.	1. මැණික් කර්මාන්ත බිඳවැටීම
2. විදේශ විනිමය ඉපයීමට හැකිවීම.	2. ගෙවුම්ශේෂ ගැටළු ඇතිවීම
3.ගුණත්වයෙන් යුතු භාණ්ඩ ලබාගතහැකිවීම.	3.අනවශ්‍ය භාන්ඩ රටතුළට පැමිණීම
4. විදේශ සම්බන්ධතා ඇතිවීම.	4. අනවශ්‍ය විදේශ බලපෑම්

(සාධාරණ කරුණු සඳහා ලකුණු ලබාදෙන්න.)

(v) (අ) 1. ලෝක වෙළෙඳ සංවිධානය (WTO) 2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
3. ලෝක බැංකුව (IBR) 4. G 7 කණ්ඩායම
(ආ) ශ්‍රී ලංකාව, ඉන්දියාව, පකිස්ථානය, නේපාලය, භූතානය, බංගලිදේශය, ඇෆ්ගනිස්ථානය, මාලදිවයින.